මාවතගම ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 27 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 26 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 අගෝස්තු 30 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>මතය</u>

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මාවතගම ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.73,487,296 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.2 <u>නිරවුල් නොකළ ගිණුම්</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). කොන්ක්‍රීට් ව්‍යාපාති හිඟ හිරි ආදායම් ලෙස දීර්ඝ කාලයක සිට ලැබිය යුතු රු.1,716,098 ක ශේෂයක් ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ආ). ප්‍රාග්ධන වියදම් ණය හිමියෝ යටතේ වාහන මිලදි ගැනිම් ලෙස රු.2,343,460 ක ණය ශේෂයක් දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විට නිශ්චිතව ණය හිමියන් හඳුනාගෙන නොතිබුණු අතර වාර්තාවේ දින වන විටද වාහන මිලදී ගැනිම් සිදුකර නොතිබුණි.

(ඇ). ණයහිමි වෙනත් යටතේ දීර්ඝ කාලයක සිට පවතින ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.650,000 ක ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම ආපසු ගෙවිය යුතු තැන්පත් යටතේ රු.2,071,509 ක් වු තැන්පතු ශේෂ 4 ක් සමාලෝචිත වර්ෂය තුලදී සමුච්චිත අරමුදල හරහා කපාහැර තිබුණි.

(ඈ). සභාවේ සේවක සුභ සාධන සමිතිය සඳහා ආපසු ලබා නොගැනීමේ අරමුණින් ලබාදී ඇති රු.25,000 ක මුදලක් දීර්ඝ කාලයක සිට අයකරගත යුතු ණය මුදලක් ලෙස ශේෂ පත්‍රයෙහි පෙන්නුම් කරමින් පැවතුණි.

(ඉ) ආදායම් ණයගැතියෝ යටතේ පවතින ලැබිය යුතු මුද්දර ගාස්තු ශේෂය වූ රු.22,165,706 ක ශේෂය තුල 2010 හා ඊට පෙර වර්ෂ වල සිට පැවත එන රු.6,165,706 ක ශේෂයක් ද ඇතුලත් වී තිබුණි.

## 2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.761,446 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,416,592 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 1,418 | 2,147 | 3,738 |
| (ii) | බදුකුලී | 6,112 | 5,978 | 2,727 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,048 | 1,042 | 77 |
| (iv) | වෙනත් ආදායම් | 39,452 | 38,285 | 19,059 |

#### 2.2.2 <u>වරිපනම් බදු</u>

සභා බල ප්‍රදේශයට අදාලව වරිපනම් ඒකක 4,336 ක් යටතේ සමාලෝචිත වර්ෂයට අදාලව බිල් කිරීම් රු.1,604,797 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් හිඟය රු.3,302,177 ක් විය. හිඟබදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය හා 1988 ප්‍රාදේශීය සභා( මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති 31-42 විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

2.2.3 බදුකුළී

(අ) සභාව විසින් දීර්ඝකාලිනව බදුදුන් කඩ කාමර වලට අදාලව මාසික වාරික 4-28 අතර කාල පරාසයක රු.314,820 ක හිඟ මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයට පැවතුණි. එමෙන්ම සභාව විසින් බදුදී තිබූ දේපල 06 කට අදාලව වර්ෂ 10 ක පමණ කාලයක සිට අයවිය යුතු රු.1,045,295 ක ශේෂයක්ද පැවතුණි.

(ආ) සභාව සතු පොදු වෙළදපොලෙහි දීර්ඝ කාලීන බදු පදනම යටතේ ධීවර සංස්ථාව හා ලංකා බැංකුව වෙත ලබාදි තිබූ කඩ කාමර වලින් ධීවර සංස්ථාවට ලබාදී තිබූ අංක 32 කඩ කාමරය 2010 ජුලි 19 දින සභාව වෙත ආපසු පවරාගෙන තිබුණද විදුලිය ලබාගැනීමේ ගැටළු මත එම කඩ කාමරය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම බදු දිමට නොහැකි වී තිබුණි. එසේම ලංකා බැංකු ගොඩනැගිල්ල 2011 සැප්තැම්බර් 30 දින සිට 2012 අගෝස්තු 01 දක්වා මාස 10 ක කාලයක් බදුදීමට නොහැකි වීමෙන් අවම ලංසුව මත සභාව වෙත රු.(25,200x10) 252,000 ක පමණ ආදායමක් උපයාගත නොහැකිව තිබුණි.

2.2.4 වෙළද බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂය අවසානයට ඉකුත් වර්ෂ වල සිට පැවත එන නිරවුල් නොකරන ලද රු.77,500 ක වෙළද බලපත්‍ර හිඟ ශේෂයක් පැවතුණි.

2.2.5 වාහන නවතා තැබීමේ ගාස්තු

සභා බල ප්‍රදේශය තුල වාහන නැවැත්වීමට අදාලව අතුරු ව්‍යවස්ථාවක් සම්මත කර නොතිබූ අතර, සභා බල ප්‍රදේශයේ පවතින ත්‍රීරෝද රථ නැවැත්වීමට අදාලව වාර්ෂිකව හෝ කාලානුරූපීව සමීක්ෂණයක් කර බල ප්‍රදේශය තුල පවතින ත්‍රීරෝද රථ ලියාපදිංචිය හෝ නැවතුම් ස්ථාන විධිමත් කිරීමක් සිදුකර නොතිබුණි.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු…528,875 ක් හා ලැබිය යුතු මුද්දර ගාසතු රු…22,165,706 ක් විය.

2.3 වත්කම් කළමනාකරණය

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ). 2011 ජනවාරි 04 දින බිම් කට්ටි සැලැස්ම අනුමත කර තිබූ අක්කර 5 රූඩ් 2 පර්චස් 7 ක් වූ මීගොල්ල දංගොල්ල වත්ත ඉඩමින් පොදු පහසුකම් සඳහා සභාවට පවරා තිබූ ඉඩම් කොටස් සම්බන්ධයෙන් 2012 සැප්තැම්බර් 12 දින සිදුකල ස්ථානීය පරීක්ෂාවේදී පර්චස් 17.5 ක් වූ අංක 18 කොටස නිසි කටයුත්තකට

නොගෙන වල්බිහිවී පැවති අතර පර්චස් 60 ක් පමණ වූ අංක 30 කොටසින් පර්චස් 7 ක පමණ ප්‍රමාණයක් ගල් තලාවකින් යුක්ත විය. එමෙන්ම 2012 අප්‍රේල් 17 දින බිම් කට්ටි සැලැස්ම අනුමත කර තිබූ පිලැස්ස හේනේපොල වලව්වත්ත ඉඩමේ කැබලි අංක 22 හා 23 ට ඉහලින් අධිබලැති විදුලි රැහැන් පද්ධතියක් පැවතියද, ඒ සඳහා රක්ෂිත වෙන් කිරීමක් සිදුව නොතිබුණි.

(ආ). සභාව සතුව රු.45,406,318 ක් පමණ වටිනා ඉඩම් හා ගොඩනැගිලි පැවතියද 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති 218 විධිවිධාන පරිදි ඉඩම් හා ගොඩනැගිලි පිලිබඳව වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. රු.12,469,434 ක් වටිනා වත්කම් සමීක්ෂණය කර පැවතියද, එකී වත්කම් සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව අගය කර නොතිබුණි.

## 2.4 <u>අයවීමට ඇති සේවක ණය</u>

සමාලෝචිත වර්ෂය අවසානයට අයවීම හිඟ හිට ඇති සේවක ණය ශේෂය රු.301,030 ක් වූ අතර ඒ තුල අවුරුදු 3 ට වඩා වැඩි කාලයක සිට හිඟ හිට ඇති සේවක ණය ශේෂය රු.292,530 ක් විය.

## 2.5 <u>සභාවට එරෙහිව හෝ සභාව විසින් ආරම්භ කර ඇති නෛතික කරුණු</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). මාවතගම පොදු වෙළඳපල එළහරක් මස් කඩය වෙනුවෙන් 2006 වර්ෂයට අදාලව පැවති රු.29,300 ක හිඟ බදු මුදල අයකර ගැනීම සඳහා නඩු අංක 12144/M යටතේ 2008 ජූනි 10 දින පවරා තිබූ නඩුව අවසන් වරට 2011 අගෝස්තු 19 දින අධිකරණය මගින් කැඳවා තිබූ අතර, එහිදී නොතිසි භාරදීමට විත්තිකරුගේ ලිපිනය දැනුම් දෙන ලෙස සභාවට නියම කර තිබුණද විගණිත දිනය දක්වා සභාව විසින් එම කාර්යය ඉටු නොකිරීම හේතුවෙන් නඩු කටයුතු ඇණහිට තිබුණි.

(ආ). සභාවේ ආයුර්වේද වෛද්‍ය නිලධාරිනිය ස්ථාන මාරු කිරීම සම්බන්ධව නඩු අංක SC(FR)137/2011 යටතේ අදාල වෛද්‍යවරිය විසින් සභාවට හා තවත් අයට එරෙහිව නඩු පවරා තිබූ අතර, ඒ වෙනුවෙන් නඩු ගාස්තු ලෙස රු.136,000 ක් සභා අරමුදලෙන් වැයකර තිබුණි.

(ඇ) පරිසරයට හානිදායක අයුරින් වී මෝලක් පවත්වාගෙන යාම පිලිබඳව එහි අයිතිකරුට එදිරිව සභාව විසින් 2012 නොවැම්බර් 03 දින නඩු අංක 7148 යටතේ නඩු පවරා තිබුණි.

## 2.6 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සභාව විසින් සංයුක්ත සැලැස්මක් හෝ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එමෙන්ම අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුවක් පත්කර නොතිබූ අතර, අභ්‍යන්තර විගණන වැඩසටහනක් යටතේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක්ද සිදුව නොතිබුණි.

(ඈ). පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු…3,253,344 ක් ව තිබුණි. එමෙන්ම සභාවට අදාල මාසක වාරිකය ලෙස රු…9,710 බැගින් එකී අරමුදල විසන් අයකර පැවතයද, එකී අයකිරීම් සභාවේ කුමන සෙවකයන්ට අදාලවද යන්න සභාව දැනුවත් වී නොතිබුණි.

2.7 <u>ප්‍රමාණවත් අධිකාරි බලයකින් ආවරණය නොවූ ගනුදෙනු</u>

මූල්‍ය ප්‍රකාශන වල නිරවුල් නොකර දීර්ඝ කාලිනව පවත්වාගෙන එමින් තිබූ ජල ව්‍යාපෘතියට අදාල රු.5,628,507 ක් වටිනා ගිණුම් ශේෂ 08 ක් සමාලෝචිත වර්ෂය තුලදී කපාහැර තිබූ අතර, හිඟ ආදායම් කපා හැරීම සඳහා පළාත් පාලන කොමසාරිස්ගෙන් විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි

2.8 <u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>

ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා පිළිසරු ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය මගින් සභාවට රු.මිලියන 6 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර, මධ්‍යම පරිසර අධිකාරිය සමඟ 2011 නොවැම්බර් 04 දින ඇතිකරගත් ගිවිසුම් ප්‍රකාරව 2011 අප්‍රේල් 04 දින ව්‍යාපෘතියේ ඉදිකිරීම් නිමකල යුතුව තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියට අදාලව රු.2,650,223 ක පිරිවැයක් පමණක් දරා තිබූ අතර ව්‍යාපෘතියේ ඉදිකිරීම් නිමකර අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු ආරම්භ කර නොතිබුණි. ඉහත ප්‍රතිපාදන වලට අමතරව පිළිසරු ව්‍යාපෘති ඒකකය විසින් සභාව වෙත 2012.09.05 දින කොම්පෝස්ට් හලන යන්ත්‍රයක් හා 2012.10.23 දින ට්‍රැක්ටර් රථයක්ද ලබාදී තිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ). වත්කම් කළමනාකරණය